# ශ්‍රී ලංකාවේ දී සහාය ලබා ගන්නේ මෙහෙම යි!

## ශ්‍රී ලංකාවේ දී නූතන වහල්භාවය, බලහත්කාරයෙන් සේවයේ යෙදවීම හා මිනිස් ජාවාරම පිළිබඳ වාර්තා කළ යුතු
## ආකාරය සහ ආරක්ෂිතව සංක්‍රමණය වීම පිළිබඳ දැනුවත් වන්න.

ලොව පුරා මිලියන 28ක ජනතාවක් යම්
අයුරකින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට බඳුන් වී
ඇත. සංක්‍රමණික නොවන සේවකයින්ට සාපේක්ෂව සංක්‍රමණික සේවකයින් බලහ
ත්කාරයෙන් සේවයේ යොදා ගැනීම තුන් ගුණයක් ඉහළ ය.

2022 වසර වන විට ශ්‍රී ලංකිකයෝ මිලියනයකට වඩා වැඩි
පිරිසක් විදේශයන්හි සේවයේ යෙදී සිටියහ.  ඒ අතරින් බොහෝ දෙනෙකුව
උපක්‍රමශීලී ව තමන් කිරීමට අදහස් කළ රැකියාවට වඩා වෙනස් රැකියාවන්හි
යොදවා තිබිණි.

පොරොන්දු වූ වැටුප නොලැබීම, ණය , තර්ජන හෝ වීසා සම්බන්ධ හේතු
නිසා රැකියාව වෙනස් කිරීමට හෝ අන්අයකු ළඟ සේවයට යාමට ඉඩ නොලැබෙන
තත්ත්වයක් ඔවුනට උදා වී තිබිණ.

අභිමානය සුරැකෙන පරිදි හා ගෞරවාන්විත
ව රැකියාව කිරීමේත්, සාධාරණ සැලකුම් ලැබීමේත්, අයිතිවාසිකම්
සෑම සේවකයෙකුට ම ඇති බව මතකයේ රඳවා ගැනීම වැදගත් ය.

ඔබේ අයිතිවාසිකම් හා පැමිණිල්ලක් කළ යුත්තේ කෙසේ ද යන්න ඉගෙන ගැනීමට
ප්‍රමාණවත් කාලයක් යොදවන්න.

## නූතන වහල්භාවයට එරෙහි ව ලංකාවේ දී
## වාර්තා කළ හැක්කේ කාට ද?

මිනිස් ජාවාරමට එරෙහි ජාතික කාර්ය සාධක බලකාය
දුරකතන අංකය - 076 8 447 700

ඔබට දැනටමත් උපකාර අවශ්‍ය ද?

අමතන්න, ශ්‍රී ලංකාවේ පිහිටි විගමණිකයින් සඳහා වන ජාත්‍යන්තර ආයතනය - 076 6 588 688

මිනිස් ජාවාරමට එරෙහි වීම සඳහා උපදෙස් ලබා ගැනීමට ද එම අංකය ඇමතිය හැක.

# සුරක්ෂිත සංක්‍රමණයක් සඳහා තොරතුරු ලබා ගන්නේ කෙසේ ද?

සුරක්ෂිත ව විදේශ ගතවීම සඳහා තොරතුරු ශ්‍රී
ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා ගත හැක.

විදේශ ගතවීමට පෙර ඔබේ අයිතිවාසිකම් දැනගන්න.  විදේශ ගතවීම ජීවිතය වෙන
ස් කරන අත්දැකීමක් විය හැකි නමුත් වඩා වැදගත් වන්නේ, එම වෙනස
ඔබේ ජීවිතය වඩා යහපත් කරන වෙනස්කමක් බවට පත් කර ගැනීම යි.